20 YEARS IN THE FIGHT AGAINST CORRUPTION

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

a nation that upholds integrity

කෙටි අධ්‍යයන සටහන්

# නිදහස් හා සාධාරණ මැතිවරණ:

## අදහස් ප්‍රකාශ කිරීමේ තීරණාත්මක අංගයකි

# භාෂණයේ නිදහස් යනු සියල්ලම ය, එයට සියල්ල අයිති වේ, භාෂණයේ නිදහස යනු ජීවිතයමය.

**- සල්මන් රුෂ්ඩි**

## හැඳින්වීම

පොදු ආයතන සඳහා පුද්ගලයකු තෝරා ගැනීමේ විධිමත් ක්‍රියාවලිය හෝ දේශපාලන යෝජනාවක් ඡන්දයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනම වන්නේය. එමෙන්ම මැතිවරණයේ ස්වරූපය සහ එහි හරය අතර වෙනස හඳුනා ගැනීම වැදගත්ය.[1] මැතිවරණ සඳහා නීතිය තුළ ඔවුන්ගේ ම ක්‍රියා පටිපාටින් ඇති නමුත් විවිධාකාරවූ අභ්‍යන්තර හා බාහිර සාධක හේතුවෙන් මැතිවරණවල හරය නැති විය හැකිය. බොහෝ දුරට එය සිදුවිය හැක්කේ ඡන්දදායකයින්ට සහ විරුද්ධ මත දරන්නන්ට තම දේශපාලන අදහස් නිදහස් හා සාධාරණ ලෙස ප්‍රකාශ කිරීමට පරිසරයක් නොමැති විට සහ අපේක්ෂකයින්ට හෝ පක්ෂවලට තරග කිරීම සඳහා සමබිමක් නොමැති විටය. බේරුක් මෙස්ෆින් (Berouk Mesfin) පවසන පරිදි "බිඳුණු යැයි සලකන ලද හෝ ස්ථාවර ලෙස ස්ථාපිතවූ හෝ වේවා ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක පදනම් කුළුණු ලෙස නිසැකව ම මැතිවරණ පවතී"[2]

සල්මන් රුෂ්ඩි පවසන පරිදි "ප්‍රකාශනයේ නිදහස යනු කුමක්ද? අකැමැති වීමට නිදහසක් නොමැතිව එය පැවැත්මට නොහැක." මැතිවරණ පැවැත්වීම මගින් පවතින දේශපාලන ක්‍රමයට සහ/හෝ පාලකයන්ට එකඟ වීමට හෝ එකඟ නොවීමට අවශ්‍යය නිදහස ලබා දෙනු ලැබේ. ශ්‍රේෂ්ඨ නිදහස් ක්‍රියාකාරිකයෙකු වන පූජක මාටින් ලූතර් කිංග් ජූනියර් විසින් 1968 අප්‍රේල් 3 වැනිදා ස්වකීය අවසන් දේශනයේදී ප්‍රකාශ කරන ලද පරිදි මැතිවරණයන්හි සුවිශේෂිත්වය නම්, එය ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පමණක් නොව, නිදහසේ කතා කිරීමේ අයිතිය, රැස්වීමේ අයිතිය, සමාගමේ අයිතිය, මාධ්‍ය නිදහස සහ විරෝධතා දැක්වීමේ අයිතිය ද ආරක්ෂා කරනු ලැබේ.

මැතිවරණ පැවැත්වීම, ක්‍රියාත්මක වන ඕනෑම රටක පවතින පාලන ක්‍රම සහ එහි දේශපාලන ක්‍රියාකාරීන්ට එහි සාමාන්‍ය ජනතාව වෙනුවෙන් සෑම ආකාරයකම දේශපාලන, ආර්ථික හා සමාජීය තීරණයක් ගැනීමේ වගකීම ඇත. එය හුදෙක් යම් කාලයක් සඳහා රටක් පාලනය කිරීම සඳහා පුද්ගලයෙකුට හෝ පක්ෂයකට තම මනාපය පෙන්වීමට ඡන්දය භාවිතා කරන ක්‍රියාවලිය පමණක් නොව එය රජයන් සහ නිලතල දරන්නන් වගකීමට බැඳ තබන්නක් ද වේ. ඔවුන් පුරවැසියන්ගෙන් ඡන්දය ලබා ගැනීමට පෙර ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් හරහා ජනතාවගේ අවශ්‍යතා ඉටු කළ යුතු අතර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය.

ශ්‍රී ලංකාව සිටින්නේ සංක්‍රාන්ති සමයක ය. වත්මන් ආර්ථික පසුබෑම, පශ්චාත් කෝවිඩ් ප්‍රතිවිපාක, සංචාරකයන් පැමිණීමේ හිඟකම, විදේශ විනිමය හිඟය, තරුණ හා වෘත්තිකයන්ගේ සංක්‍රමණයේ ශීඝ්‍ර වැඩිවීමකට තුඩු දෙන ඉහළ විරැකියාව මෙලෙස සමාජ ආරක්ෂාව සහ රටේ ස්ථාවරත්වය සම්බන්ධයෙන් දැවැන්ත අස්ථාවරත්වයක් ඇති කර තිබේ. වත්මන් ආර්ථික අර්බුදය පසුගිය වසර එකහමාර තුළ ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ නැගීමක් ඇති කිරීමට හේතු වී තිබේ.[3] අනෙක් අතට දේශපාලන අස්ථාවරත්වයේ පිපිරීම් සහ පසුගිය වසර දෙක තුළ දේශපාලන දාමරිකයන් විසින් විවෘත පොදු ස්ථානවල සිදු කරන ලද මහජන බිය ගැන්වීම් රටේ ප්‍රකාශනයේ නිදහස සහ නීතියේ ආධිපත්‍යය ප්‍රශ්න කිරීමකට ලක්කර ඇත. මේ ආර්ථික, සමාජීය, දේශපාලනික ප්‍රශ්න තුරන් කිරීම උදෙසා වසර හතරක් වන වත්මන් ආණ්ඩුව ඵලදායී බව සනාථ කිරීමට නොහැකිව ඇත.

ඒ අනුව මෙම පත්‍රිකාවේ අරමුණ වන්නේ ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී තත්ත්වයක් තුළ නිදහස් හා සාධාරණ මැතිවරණ වැදගත් වන්නේ ඇයිද යන්න පිළිබඳ ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය දෙස අවධානය යොමු කරමින් විද්වත් අදහස් හා පවතින දත්ත උපයෝගී කරගනිමින් විශ්ලේෂණයක යෙදීමය.

1. Webb, Paul David., Gibbins, Roger & All. Election: Political Science. (2024, June 2). Britannica. https.://www.britannica.com/topic/election-political-science
2. Mesfin, Berouk. (2008). Democracy, Elections & Political Parties - A conceptual overview with special emphasis on Africa. Institute for Security Studies, 2. https://www.files.ethz.ch/isn/98951/PAPER166.pdf
3. Weeratunga, Manori. & Fernando, Eranda Roshan. Recent trends of labour migration in Sri Lanka. (2023, March 29). Daily FT. https://www.ft.lk/columns/Recent-trends-of-labour-migration-in-Sri-Lanka/4-746819

# සාහිත්‍ය විචාරය

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) විවිධ වගන්ති මගින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ අදහස එහි අන්තර්ගත කර ඇත. 18 වැනි වගන්තිය සිතීමේ අයිතිය සහතික කර ඇත. 19 වැනි වගන්තිය මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ බාධාවකින් තොරව අදහස් දැරීමේ නිදහස සහ දේශසීමා නොතකා ඕනෑම මාධ්‍යයක් හරහා තොරතුරු සහ අදහස් සෙවීමට, ලැබීමට සහ ලබා දීමට ඇති නිදහස විදහා දක්වයි.[4] මැතිවරණවලදී, රැස්වීමේ නිදහස සඳහා ඇති අයිතිය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මන්ද එය ඡන්දදායකයින්ට සහ අපේක්ෂකයින්ට එක්රැස් වීමට හා එකිනෙකාගේ අදහස් හුවමාරු කර ගැනීමට වේදිකාව සකසනු ලැබේ. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) හි 20 වැනි වගන්තිය යටතේ මෙම අයිතිය පිළිගෙන තිබේ.

UDHR හි 21 වන වගන්තිය, ජනතාවගේ කැමැත්ත රජයේ අධිකාරියේ පදනම විය යුතුය; කාලානුරූපීව හා අව්‍යාජ මැතිවරණ තුළ, සර්වජන හා සමාන වූ ඡන්ද බලය මගින් සහ රහස් ඡන්දයෙන් හෝ ඊට සමාන නිදහස් ඡන්ද ක්‍රියා පටිපාටි මගින් මෙය ප්‍රකාශ කළ යුතුය.[5] සෑම පුරවැසියෙකුටම සමාන පදනමක් මත මැතිවරණවලට සහභාගී වීමේ සක්‍රීය අයිතිය සහ අවස්ථාව ඇති බව සහතික කිරීමේ විශේෂ වගකීම එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මෑතකදී නැවත තහවුරු කරන ලදී.[6]

කීර්තිමත් ඇමරිකානු මහාචාර්යවරයෙකු සහ දේශපාලන විචාරකයෙකු වන අව්රාම් නෝම් චොම්ස්කි (Avram Noam Chomsky) උපුටා දක්වන්නේ "ඔබ කතා කිරීමේ නිදහස විශ්වාස කරන්නේ නම්, ඔබ කැමති නැති අදහස් සඳහා කතා කිරීමේ නිදහස විශ්වාස කරයි. ඔබ කතා කිරීමේ නිදහසට පක්ෂ නම්, එයින් අදහස් වන්නේ ඔබ හෙළා දකින අදහස් සඳහා නිසැකවම කතා කිරීමේ නිදහසට පක්ෂව සිටින බවයි."[7]

*Manufacturing Consent – the political economy of the mass media* ප්‍රකාශනය තුළ, චොම්ස්කි සහ එඩ්වඩ් එස්. හර්මන් (Edward S. Herman) මැතිවරණවලදී මාධ්‍යවල බලපෑම සහ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට සහ පාලනය කිරීමට මාධ්‍යයේ බලපෑම පිළිබඳව ඉතා ගැඹුරින් සාකච්ඡා කළහ. තේරුමක් නැති තුන්වන ලෝක මැතිවරණවලට එදිරිව නීත්‍යානුකූල කිරීම යන තේමාව යටතේ; එල් සැල්වදෝරය, ග්වාතමාලාව සහ නිකරගුවාව යන රටවල් තුනක මැතිවරණ ඔවුන් විවේචනාත්මකව විශ්ලේෂණය කර ඇත. තුන්වන ලෝකයේ මැතිවරණ ප්‍රචාරක ආකෘතියක් (propaganda model) සඳහා විශිෂ්ට පරීක්ෂණ භූමියක් සපයන බව ඔවුහු පැවසූහ. සමහර මැතිවරණ ඔවුන්ගේ පාලකයන් සහ පාලන තන්ත්‍රයන් නීත්‍යානුකූල කිරීම සඳහා මිත්‍ර රාජ්‍යන්වල පවත්වනු ලබන අතර අනෙක් ඒවා එක්සත් ජනපදයේ ඇඟිලි ගැසීම් යටතේ අප්‍රසාදිත රටවල පවත්වනු ලැබේ.[8] ඒ අනුව රාජපක්ෂ සහෝදරයන්ගේ ආණ්ඩුවේ අවුල් සහගත මෑත පාලන තන්ත්‍ර සලකා බලන විට මෙය ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවන අතර ස්වාධීන සහ අපක්ෂපාතී මාධ්‍යවල වැදගත්කම මෙයින් පැහැදිලි වන්නේය.

# අන්තර්ජාතික හා ජාතික තලයේ ඉතිහාසය පිළිබද කෙටි හැදින්වීමක්

කතා කිරීමේ නිදහස සහ පාලන පද්ධතිවලට සහභාගී වීමේ නිදහස පිළිබඳ අදහසට දීර්ඝ කාලීන ඉතිහාසයක් පවතී. වසර දහස් ගණනක් බොහෝ ශිෂ්ටාචාරයන් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස සහ එහි මූලික අංග ආරක්ෂා කිරීමට දායක වී ඇත. විවිධ මතවලට ඇහුම්කන් දීම, අවබෝධය සහ විශ්වාසය ලබා දීමේ අවශ්‍යතාවය බුද්ධ දේශනාවේ පවා වැදගත් කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත.

ඡන්ද බලය අයිතිය පිළිබඳ ඉතිහාසය ආසන්න වශයෙන් ක්‍රි.පූ. 508 දක්වා දිව යන්නේය. පුරාණ ග්‍රීසියේ, ඔවුන්ට "සෘණාත්මක" ඡන්ද ක්‍රමයක් පැවැත්විණි. එනම් සෑම වසරක ම පිරිමි ඉඩම් හිමියන්ගෙන් (කාන්තාවන් සහ වහලුන් බැහැර කර ඇත) ඉදිරි වසර දහය සඳහා පිටුවහල් කිරීමට ඔවුන්ට වඩාත්ම අවශ්‍ය වන

4. UDHR
5. International Obligations for Elections - Guidelines for Legal Frameworks. (2014). International Institute for Democracy and Electoral Assistance. https://www.idea.int/sites/default/files/publications/international-obligations-for-elections.pdf
6. Ibid
7. 18 Freedom of Speech Quotes You Should Know. (2024, May). Freedom Forum. https://www.freedomforum.org/freedom-of-speech-quotes/5
8. Herman, Edward S. & Chomsky, Noam. (2008). Manufacturing Consent - The Political Economy of the Mass Media. The Bodley Head Random House

දේශපාලන නායකයාට හෝ 'අපේක්ෂකයින්ට' ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටියේය.[9] 13 වන ශතවර්ෂයේදී, වැනිසියානු රාජ්‍යය ශක්තිමත් වී සාමාජිකයින් 40 දෙනෙකුගෙන් සමන්විත මහා සභාවක් තෝරා පත් කර ගන්නා ලදී.[10] ඇමරිකානු විප්ලවය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වල හැරවුම් ලක්ෂයක් විය. 1964 ඇමරිකාවේදී, ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවක් වූ රෙනෝල්ඩ්ස් එදිරිව සිම්ස් (***Reynolds v. Sims***) නඩු තීන්දුවක් ලබා දෙනු ලැබුවේ "එක් පුද්ගලයෙක්, එක් ඡන්දයක්" මූලධර්මය යටතේ, සියලුම ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයන්හි සභා දෙකම ජනගහන ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සමාන මැතිවරණ දිස්ත්‍රික්ක මත පදනම් විය යුතු බවයි.[11] කාන්තාවන් සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයේ තවත් සන්ධිස්ථානයක් වූ අතර එය 1848 දී නිව් යෝර්ක් හි සෙනෙකා ෆෝල්ස් (Seneca Falls) හි පැවති පළමු කාන්තා අයිතිවාසිකම් සම්මුතිය සමඟ සුවිශේෂී හැරවුම් ලක්ෂයක් විය.

1931 දී ඩොනමෝර් කොමිෂන් සභාව යටතේ ලංකාවේ පුරවැසියන්ට විශ්ව ඡන්ද බලය ප්‍රදානය කරන ලද අතර වයස අවුරුදු 21 ට වැඩි පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයම ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලැබූහ. ඓතිහාසික වශයෙන් බටහිර බොහෝ සංවර්ධිත යැයි හඳුන්වනු ලැබූ රටවල්වලට පූර්වයෙන් කාන්තාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලැබුණු පළමු ආසියාතික රටවල් අතරට ලංකාව ද අයත් විය.

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මඟින් අර්ධ-ජනාධිපති පාලන ක්‍රමයක් සහ සමානුපාතික නියෝජනය (Proportional Representation - PR) ක්‍රමය හඳුන්වා දුන් අතර ඡන්ද බලය සහ මැතිවරණ සම්බන්ධ විධිවිධාන කිහිපයක් ඇතුළත් විය.[12] මේ අනුව, මැතිවරණ කොමිසමේ අධීක්ෂණයෙන් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සහ අධිකරණ මැදිහත්වීමෙන් නිදහස් හා සාධාරණ මැතිවරණ යන මූලික සිද්ධාන්තයට පටහැනිව පුරවැසියන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම වත්මන් ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ වේ. ප්‍රකාශනය ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සහතික කරන 14 (1) (අ) වගන්තියට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇතුළත් බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.[13]

## ශ්‍රී ලංකා මැතිවරණ සිතියමෙහි කුමක් සිදුවෙමින් පවතින්නේද?

ඡන්දය යනු පුරවැසියන්ට පමණක් ලැබෙන වරප්‍රසාදයක් නොවේ. තිරසාර සහ වගකීම් සහිත පාලන පද්ධති සඳහා වැඩ කිරීමේ නියෝජිතයින්ගේ හැකියාව ද එයින් පරීක්ෂා කරනු ලැබේ. එයට විරුද්ධ වීමටත් ඡන්දයෙන් නිවැරදි නියෝජිතයන් නැවත පත් කිරීමටත් ජනතාවට අයිතියක් ඇත.

ප්‍රධාන මැතිවරණ දෙකක් දින නියමයක් නොමැතිව කල් දැමීමට ශ්‍රී ලංකාව මුහුණ දී සිටී. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සපයා ඇති අතර එය 3 වැනි ව්‍යවස්ථාව යටතේ පහසුවෙන් වෙනස් කළ නොහැකි වගන්තියක් වන්නේය. කෙසේ වෙතත්, ඡන්ද බලය පිළිබඳ සඳහන් කිරීම් කිහිපයක් ඇති අතර, ඡන්දය ප්‍රකාශ කිරීම නිදහස්, සමාන සහ රහස් ඡන්දයෙන් විය යුතුය.[14] මැතිවරණ දින නියමයක් නොමැතිව කල්දැමීම තුළින් ජනතාවගේ මේ මුල් බැසගත්/ නොවෙනස් වන අයිතිය බලයේ සිටින දේශපාලනඥයන් විසින් කඩකරමින් සිටිනු ලැබේ.

පළාත් සභා මගින් මධ්‍යම රජයෙන් බලය බෙදා හැරීමක් කරනු ලැබේ. මෙම බලය බෙදීම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද සංශෝධන හරහා ලබා දී ඇත. මෙම නෛතික රාමුවට පළාත් මට්ටමින් මෙතෙක් මධ්‍යයේ ක්‍රියාත්මක වූ නිශ්චිත රාජ්‍ය බලතල සහ කාර්යයන් නැවත පළාත් මට්ටමේ ස්ථානගත කිරීම ඇතුළත් විය. පළාත් සභා වසර 5ක් තිස්සේ අක්‍රියව පවතින අතර 2022 සිට පළාත් පාලන මැතිවරණය කල් දමා ඇත. මේ අනුව මෙම ආයතන පිහිටුවීමේ අරමුණ රජය විසින් බලපෑම්සහගත ලෙස සෝදාපාලුවකට වී ඇත.

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දී ඇති පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් ලබාදීම තුළින් ප්‍රථම වරට කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ වීම ඉහළ නැංවීමේ අවස්ථාව ආමන්ත්‍රණය කෙරිණි. මේ වසර අවසන් වන විට හමුදා පාලනයන් සහ ඒකාධිපති පාලනයන් පවතින

9. History of Elections. (2024). Dual Elections. https://www.duvalelections.com/General-Information/Learn-About-Elections/History-Of-Elections
10.ibid
11. One Person, One Vote - The Constitution Project. (2019, September 24). The Constitution Project. www.theconstitutionproject.com
12. Hatch, NK. (2021). Historical Outline of Constitution Making and Development. In Hiran Jayawardene & Sharya Scharenguivel (Ed.) Perspective on Constitutional Reforms in Sri Lanka.
13. Hatch, NK. (2023) Franchise and Elections in Sri Lanka. In PAFFREL (Ed.), Democracy – Theory and practice, Sri Lankan Experience, (pp. 95-99). PAFFREL
14. Edrisinha. Rohan, & De Alwis, Sundari. The Right to Vote: Its Impact on Election Laws in Sri Lanka (2007). Centre for Policy Alternatives. www.cpalanka.org

රටවල් හැර නීතියෙන් නියම කර ඇති කාලයෙන් ඔබ්බට මැතිවරණ නොපැවැත්වූ එකම ප්‍රජාතන්ත්‍රවාදී රට බවට ශ්‍රී ලංකාව පත්වනු ඇත.

## අපට මැතිවරණයක් මේ මොහොතේ අවැසිද?

එක්තරා ආකාරයකට මෙය ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් සහ ජනතාවගේ අයිතියකි. තවද, නිදහස් හා සාධාරණ මැතිවරණ ජනතාවගේ කැමැත්ත පෙන්නුම් කරනු ලැබේ. කලාපයේ පසුගිය දශක තුනක කාලය තුළ දක්නට ලද දේ නම් තායිලන්තය, මියන්මාරය සහ පිලිපීනය වැනි රටවල් අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීමේ බරපතල අනතුරකට මුහුණ දී සිටින බවය. මිලිටරි ආඥාදායකත්වය විසින් ආණ්ඩු අහිබවා යාම සහ පරිපාලන පද්ධතිවලට මිලිටරි ජුන්ටාව මැදිහත් වීම මැතිවරණ නිදහස් හා සාධාරණ නොවීමට හේතු වී ඇත. රාජපක්ෂ පාලන සමයේදී ශ්‍රී ලංකාව වඩ වඩාත් විවෘතව හමුදා රාජ්‍යයක් කරා ගමන් කරමින් සිටියේ විරුද්ධ මත දරන මාධ්‍යවේදීන් බිය ගැන්වීම් සහ අතුරුදහන් කිරීම් සහ ඡන්දදායකයින්ට තර්ජන එල්ල කරන ලද බව රහසක් නොවීය. වත්මන් ලිබරල්වාදී යැයි සලකගන්නා ජනාධිපති රනිල් වික්‍රමසිංහ දිගටම කරගෙන යනු ලබන්නේ රාජපක්ෂ සහෝදර න්‍යාය පත්‍රයම ය. ජනාධිපති වික්‍රමසිංහ විසින් ආන්දෝලනාත්මක ලෙස පරිපාලන හා රාජ්‍ය තාන්ත්‍රික සේවයේ හිටපු සහ වත්මන් හමුදා නිලධාරීන් සහ මූලික අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව බරපතල නීතිමය චෝදනා ඇති පොලිස්පතිවරයෙකු පත් කරනු ලැබීය.

## ජනතා වරමට ගරු කිරීම

ජනවරමකින් තොරව පත් කළ නිසා වික්‍රමසිංහ ජනාධිපතිවරයා මීට පෙර ජනාධිපතිවරයෙකු පත් කළ ආකාරයට පත් කර නොමැති බව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රමිඳු ලක්බිත පෙරේරා මහතා පවසයි. කෙසේ වෙතත්, ඔහු රාජ්‍යය වෙනුවෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීම, රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය වැනි ඉදිරි දශක කිහිපය තුළ රටට කල්පවත්නා බලපෑමක් ඇති කරන්නාවූ තීරණ ගනිමින් සිටී. ජනාධිපති වික්‍රමසිංහගේ මෙම ක්‍රියාදාමයන් ඡන්ද ලක්ෂ 69ක් ලබාගත් ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට සම්පූර්ණයෙන් විරුද්ධ වන්නකි.

ජනතා වරමෙන් තොරව කිසිවකුට දේශපාලන තීන්දු ගැනීමට අයිතියක් නොමැත. මෙය ප්‍රජාතන්ත්‍රවාදය තුළ මූලික ගැටලු ඇති කරනු ලබයි. මැතිවරණ නොපැවැත්වීම හේතුවෙන් වත්මන් නියෝජනයේ වගවීම සහ විනිවිදභාවය ඇනසිටීමකට ලක්ව ඇත. එබැවින් මැතිවරණයකින් ජනවරම ලබාගැනීමට වික්‍රමසිංහ ජනාධිපතිවරයා නීත්‍යානුකූලව බැඳී සිටිනු ලැබේ.

## විනිවිධභාවයකින් යුතු මහජන නියෝජනයක් ලබා ගැනීම උදෙසා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රතිපාදන ලබා දී ඇති පරිදි මැතිවරණයකින් මහජන නියෝජිතයන් පත් කිරීම දේශපාලකයන්ගේ කැමැත්ත හා සිතු සිතු පරිදි කළ හැකි දෙයක් නොවන්නේය. එය නීතියෙන් අනිවාර්ය වන්නකි. මේ වන විට පළාත් සභා සහ පළාත් පාලන ආයතන අක්‍රියව පවතින අතර වත්මන් ජනාධිපතිවරයා පත් කිරීම ජනතා වරමකින් තොරව සිදුව ඇත. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති ජනතා පරමාධිපත්‍ය බලතල ක්‍රියාත්මක කිරීම උල්ලංඝනයවී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂඥ ජනාධිපති නීතීඥ නයිජල් හැච් පවසන ආකාරයට, "පාර්ලිමේන්තුව වාර්ෂික අයවැයෙන් මැතිවරණ සඳහා අරමුදල් සඳහා ඡන්දය දෙනු ලැබේ. ඒ අනුව අවශ්‍ය ඕනෑම මැතිවරණයකට උවමනා මුදල් පාර්ලිමේන්තුව සම්මත කළ පසු විධායකයට හෝ ව්‍යවස්ථාදායකයට ඒ සම්බන්ධයෙන් තවත් කාර්ය භාරයක් ඉටු කිරීමට නොමැත. එකම කාර්යභාරය නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කිරීමය. විධායකයට මැතිවරණ පැවැත්වීම යටපත් කිරීමට නොහැක. වෙනත් සමාජ හා ආර්ථික පසුබෑමක් ගැන චෝදනා නොකර ඔවුන් එම අරමුදල් වියදම් කළ යුතුය." ජනාධිපතිවරයාගේ සිට පහළට විධායකයේ සහ රාජ්‍ය සේවයේ සියලු ම සාමාජිකයින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිසමට සහාය වීමට බැඳී සිටින බව ඔහු අවධාරනය කරනු ලැබීය. ඒ අනුව වත්මන් ආණ්ඩුව බලය අහිමි වේ යැයි බියෙන් පසුවන බව පැහැදිලිය.[15]

15. Hatch, NK (2024, May 18). Free and fair elections: challenging the law (BA Sunethra, Interviewer) [Personal Communication]

# මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම

අරගලය කාලසීමාවේදී රාජපක්ෂ ආණ්ඩුව තම උපරිම බලය යොදවා ඕනෑම ආකාරයක ජනතා අප්‍රසාදයක් නිහඬ කිරීමට කටයුතු කරනු ලැබීය. විධායකය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අනෙකුත් මහජන නියෝජිතයන් ආර්ථික හා දේශපාලන කඩාවැටීම සමඟ පුරවැසියන් කම්පනයට පත් කළහ. බොහෝ පුරවැසියන් ඉන්ධන සහ ප්‍රතිපාදන වැනි මූලික අවශ්‍යතා ලබා ගැනීමට සහ අවශ්‍ය බෙහෙත් නොමැතිව දින ගණන් පෝලිම්වල සිටගෙන සිටියදී සිය ජීවිත අහිමි විය.

මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත් වූ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරු ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරයන් අමානුෂික ලෙස උල්ලංඝනය කරන්නා වූ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ( ICCPR), 2024 රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචිය හා නියාමනය) පිළිබද පනත, මාර්ගගත ආරක්ෂණ පනත (OSA) සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) සම්මත කළහ. සමාජ ක්‍රියාකාරීන් සහ දේශපාලන ක්‍රියාකාරීන් දහස් ගණනක් දැන් මෙම කුරිරු නීති භාවිතා කරමින් නීත්‍යානුකූලව අත්අඩංගුවට ගෙන ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වසර 40 කට වැඩි කාලයක් තිස්සේ අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම, වධහිංසා පැමිණවීම් හරහා බොරු පාපොච්චාරණ ලබා ගැනීම සහ සුළුතර ප්‍රජාවන් සහ සිවිල් සමාජ කණ්ඩායම් ඉලක්ක කර ගැනීම සඳහා භාවිතා කර ඇත.[16] ත්‍රස්ත මර්දන නීතිය මගින් මුස්ලිම් සහ දෙමළ ජනතාව ඉලක්ක කර තිබෙන අතර 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය පදනම් කරගනිමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ප්‍රතිත්‍රස්ථ පනත (ATA) ලෙස අලුත් කරන ලදී.[17] පවතින නීති භාවිතා කරමින් සහ නව නීති සම්මත කිරීමෙන් රජය උත්සාහ කරන්නේ රැස්වීමේ නිදහස, එකට එකතු වීමේ නිදහස, මාධ්‍ය නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස වැනි සෑම ආකාරයක ම අයිතිවාසිකම් සීමා කිරීමටය.

# මැතිවරණ කොමිසමේ ස්වාධීනභාවය ප්‍රශ්නාර්ථ ගත වීම

ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට අදහස් කරන මැතිවරණ කොමිසම තම රාජකාරිය සතුටුදායක ලෙස ඉටු නොකරනු ලැබේ. ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් පාර්ශව ගණනාවක් අභියෝග කරන මැතිවරණ නොපැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාග වෙමින් පවතී. මෙම මැතිවරණ පැවැත්වීම සඳහා 2022 දී රුපියල් බිලියන 1ක් නිදහස් කිරීමට පාර්ලිමේන්තුව ඡන්දය ප්‍රකාශ කර ඇතත්, ආර්ථික අර්බුදය සහ වෙනත් අත්‍යවශ්‍ය සමාජ සහ සුබසාධන කටයුතු සඳහා මෙම මුදල් අවශ්‍ය යැයි කියන පදනම සඳහන් කරමින් රනිල් වික්‍රමසිංහගේ පාලනය එම මුදල් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීය.

මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නොමැති ආකාරයෙන් දැන් රට සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් තිබෙන බව පැහැදිලිය. අධිකරණයට ගොස් මෙම මුදල් නිදහස් කරන ලෙස රජයට බල කරනවා වෙනුවට මැතිවරණ කොමිසම කථානායකවරයාට ලිඛිත ඉල්ලීමක් සිදු කරමින් කථානායකවරයාගෙන් මෙම ගැටළුවට මැදිහත් වන ඉල්ලා සිටියේය. මේ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින සාකච්ඡා වැළැක්වීමට හෝ මැඩපැවැත්වීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට රජය උත්සාහ කිරීමක් මින් සිදුවිය.[18]

ඉන්දියානු මැතිවරණ කොමිෂන් සභාව සාධාරණ හා විධිමත් මැතිවරණ පවත්වනු ලැබේ.[19] ජනාධිපති නීතිඥ නයිජල් හැච් පවසන පරිදි ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ඉන්දියාවේ ප්‍රබලතම ආයතනවලින් එකක් වන ඉන්දියානු මැතිවරණ කොමිෂන් සභාව හා ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිසම කිසිසේත් සන්සන්දනය කළ නොහැකි බව වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලැබීය. ශ්‍රී ලංකාව තුළ විධායකය හෝ ව්‍යවස්ථාදායකය ඔවුන්ගේ උපදෙස්වලට පටහැනි නොවන හෝ ප්‍රතිවිරෝධී නොවන අඛණ්ඩතාව සහ අපක්ෂපාතීත්වය පිළිබඳ මට්ටමක් තවමත් මැතිවරණ කොමිෂන් සභාව විසින් ස්ථාපිත කර නොමැත. ස්වාධීන වීමට අදහස් කරන ආයතන පවා විධායක බලය වෙත දණ නැමෙනු ලැබේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සමාජ ක්‍රියාකාරීන් බොහෝ දෙනෙකු පෙළඹී සිටින ප්‍රජාතන්ත්‍රවාදී රටක එවැනි බලයක් සම්බන්ධයෙන් බලවත් කනස්සල්ලක් මතු කර ඇත්තේ එවැනි පුළුල් බලය පැවතීම සහ ඊටත් වඩා වැඩි බලයක් නිලතල දරන්නන් විසින් ක්‍රියාත්මක කරන බැවිණි.

16. In a Legal Black Hole - Sri Lanka's Failure to Reform the Prevention of Terrorism Act. (2022, February 7). Human Rights Watch. https://www.hrw.org/report/2022/02/07/legal-black-hole/sri-lankas-failure-reform-prevention-terrorism-act
17. ibid
18. Dr. Harini Amarasuriya Vs. KM Mahinda Siriwardena Et all (2023)
19. Encyclopedia Britannica, Election Commission of India. (2024, June 12). Britannica. https://www.britannica.com/topic/Election-Commission-of-India

පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමේ දිනය තීරණය කිරීම නියමිතව එවකට සිටි කොමසාරිස්වරුන් කළ ආකාරයෙන් (මැතිවරණ කොමිසම පිහිටුවීමට පළමුව) මැතිවරණ කොමිසමට අවශ්‍ය පරිදි රැස්වීම් නොතිබූ බව මැතක දී මතුවිය. නමුත් මෙම චෝදනා තවමත් නීතියෙන් ඔප්පු කර නොමැත. නමුත් ඔවුන්ට නිසි රැස්වීම් හෝ නිසි න්‍යාය පත්‍රයක් නොතිබුණු බවට චෝදනාව එල්ල වී තිබීමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිසමේ බරපතළ අඩුපාඩු ගණනාවක් තිබෙන බවය.

සිත්ගන්නා කරුණ නම්, මැතිවරණ කොමිසම ව්‍යවස්ථාදායක ආයතනයක් ලෙස පිහිටුවීමට පූර්වයෙන් පෙර එහි තිබුණේ මැතිවරණ දෙපාර්තමේන්තුව පමණක් වන නමුත් නීතියට අනුව මැතිවරණ පවත්වනු ලැබීය. මැතිවරණ දෙපාර්තමේන්තුවක් යටතේ සරලව ක්‍රියාත්මක වූ හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට සාපේක්ෂව මැතිවරණ කොමිසම ව්‍යවස්ථාව යටතේ වෙනම ස්වාධීන ආයතනයක් වුවද එය නිෂ්ඵල සහ මුළුමනින්ම සංකේත ආයතනයක් බව ඔප්පු වෙමින් තිබේ.

සිවිල් යුද්ධය පැවති දරුණුත ම කාලවලදී පවා මැතිවරණ දෙපාර්තමේන්තුවට මැතිවරණ පැවැත්වූ (උදා: 2001 කටුනායක ගුවන් තොටුපළ මරාගෙන මැරෙන ප්‍රහාරය) මැතිවරණවලට මුදල් නිකුත් කරන ලදී. හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට පොලිස් බලතල නොතිබූ අතර, ඒ අනුව ඔහුට ආරක්ෂාව සහ සැපයුම් සම්බන්ධ ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදු වුවද, තවමත් ස්වාධීනව කටයුතු කරමින් තම රාජකාරිය ඉටු කරනු ලැබීය. ඒ අනුව ජනාධිපතිවරයා විසින් ස්වාධීන කොමිෂන් සභාවලට පත්කිරීම් මැතිවරණ කොමිසමේ ක්‍රියාකාරීත්වයේ ස්වාධීනත්වය අඩාල කර ඇති බව එයින් පෙන්නුම් කෙරේ. මැතිවරණ කොමිසම් සභාවෙහි සාමාජිකයින් වෘත්තීය මට්ටමින් සහ පුද්ගලික මට්ටමින් ඔවුන්ට බලපාන්නාවූ ආතතිය සහ බලපෑම් හේතුවෙන් විටින් විට ඉල්ලා අස්වී ඇත.

## නිර්දේශ හා නිගමනය

පුරවැසියන් උගත් විට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන දැනුවත් වූ විට සාක්ෂාත් කරගත නොහැකි දෙයක් නොමැත. එමෙන්ම ද්විතීයික අධ්‍යාපන ක්‍රමය තුළ සිවිල් පාඩම් අනිවාර්ය විය යුතුය. අධිකරණයත් ස්වාධීන විය යුතුය. සිවිල් සංවිධාන ක්‍රියාකාරී විය යුතු අතර ඒවායේ ගතානුගතික උපාය මාර්ගවලින් ඔබ්බට ගමන් කළ යුතුය. වත්මන් දේශපාලන සන්දර්භයන් සහ උපාය මාර්ග තුළ විවිධ චලනයන් සහ උපක්‍රම හඳුනා ගැනීමට සහ ඒවාට ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වගකීම දරනු ලබන්නේය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) සහ Transparency International Sri Lanka (TISL) ආයතනය පොදු අවශ්‍යතා සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් වනු ලබන අතර කෙසේ වෙතත්, පුරවැසියන් ලෙස අප මැතිවරණ කොමිසමේ ස්වාධීනත්වය ප්‍රශ්න කළ යුතුය. නෛතික උපාය මාර්ග සාර්ථක නොවන්නේ නම්, මැතිවරණය නොපැවැත්වීම සම්බන්ධයෙන් මහජන ව්‍යාපාරයක් ඇති කළ යුතුය. මන්ද මෙය ඔවුන්ගේ ස්වෛරී සහ අහිමි කළ නොහැකි අයිතියක් වන්නේය. මාධ්‍ය විසින් රජය විසින් ගනු ලබන ඕනෑම ආකාරයක නීතිවිරෝධී ක්‍රියාවක් ඉස්මතු කර වාර්තා කළ යුතු අතර එවැනි ක්‍රියා ප්‍රසිද්ධියේ හෙළා දැකිය යුතුය. මෙය සමාජ සමතුලිතතාවයක් ඇති කරනු ලැබේ.[20] දේශපාලකයින් දූෂිත වීම හෝ ස්වාර්ථය වෙනුවෙන් කටයුතු කිරීම අපට නැවැත්විය නොහැකි නමුත් මහජනතාවට ඔවුන්ගෙන් දිගින් දිගටම ප්‍රශ්න කළ හැකි වන්නේය. පරිසමාප්ත ආණ්ඩු නොමැති අතර තීරණාත්මක තීරණ ගැනීමේදී ජනමත විචාරණ පැවැත්විය යුතු වන්නේය. මැතිවරණ කොමිෂන් සභාව දැනටමත් මහජන විශ්වාසය නැති කර ගෙන ඇති බැවින්, එය කෙරෙහි මහජන විශ්වාසය යළි ස්ථාපිත කිරීමට සහ ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට ඔවුන්ගේ ව්‍යවස්ථාපිත වරම ඉටු කළ යුතු වන්නේය.

බහුවිධ සමාජ-ආර්ථික හා තාක්ෂණික ගැටළු හේතුවෙන් ආරක්ෂක නිලධාරීන්, සුපිරි වෙළඳපල සහ වෙළඳ කලාප සේවකයින්, බෞද්ධ භික්ෂුණීන්, ආබාධිත පුරවැසියන්, සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සහ මාධ්‍යවේදීන් වැනි පුරවැසියන් ගණනාවක් මැතිවරණ දිනයේදී ඡන්දය ප්‍රකාශ කිරීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දී සිටිති. එබැවින්, සමාජයේ එවැනි කොටස්වල අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට සහ වඩාත් ඇතුළත් සහ ප්‍රවේශ විය හැකි ඡන්ද ක්‍රමයක් හඳුන්වා දීමට රජය සහ මැතිවරණ කොමිෂන් සභාව අවශ්‍ය පියවර ගත යුතුය.

20. Perera, Ramindu Lakkhika. (2024, May 15). Consequences of postponing elections in Sri Lanka (BA Sunethra, Interviewer) [Personal Communication]

සෑම මැතිවරණයකදී ම සාමාන්‍ය ඡන්ද ප්‍රමාණයක් හා සමානව තැපැල් ඡන්ද ප්‍රතික්ෂේප වීම ඉහළ පවතින අතර මැතිවරණ කොමිසම සහ රජය එය අවම කිරීම සඳහා පියවර ගත යුතු වීම තවත් කරුණකි. සුදුසු දැනුවත් කිරීමේ ව්‍යාපාර අනිවාර්ය විය යුතුය. එය අවම කිරීම සඳහා තරුණයින් සහ වැඩිහිටියන් දැනුවත් කිරීම සඳහා සිවිල් සංවිධාන විවිධ වේදිකාවන් භාවිතා කළ යුතුය. මැතිවරණ කාලවලදී ජනතාවගේ ඡන්දය වෙනස් කිරීමට මාධ්‍ය ප්‍රචාරණයක් ලෙස යොදා ගැනීම අනිවාර්යයෙන් නියාමනය කළ යුතු තවත් කරුණකි. කුඩා පක්ෂවලට සහ ස්වාධීන අපේක්ෂකයින්ට තම දේශපාලන මතය ප්‍රකාශ කිරීමට ජාතික මාධ්‍ය වෙත ප්‍රවේශවීමේ සාධාරණ ක්‍රියාවලියක් ගොඩනැගිය යුතුය. සෑම අපේක්ෂකයෙකුට ම මැතිවරණවලදී සමබිමක් ඇති කිරීමට නම්, මැතිවරණ කාලය තුළ පොදු දේපළ පරිහරණය කිරීම ද තහනම් කළ යුතුය. තවද, මැතිවරණ ව්‍යාපාර සඳහා වත්කම් සහ පරිත්‍යාගශීලීන් සම්බන්ධයෙන් විනිවිදභාවය පිළිබඳ නීතියෙන් අනිවාර්ය කළ යුතුය. අපේක්ෂකයින් තම සහ ආසන්නත ම පවුලේ පවතින වත්කම් අනිවාර්යයෙන් හෙළිදරව් කළ යුතු අතර මැතිවරණ පරිත්‍යාගවලට අදාළ ගිණුම් නිකුත් කළ යුතුය.

- අවසානය -

# REFERENCES

*Dr. Harini Amarasuriya Vs. KM Mahinda Siriwardena Et all* (2023)

Edrisinha. Rohan, & De Alwis, Sundari. *The Right to Vote: Its Impact on Election Laws in Sri Lanka* (2007). Centre for Policy Alternatives. www.cpalanka.org

Encyclopedia Britannica, *Election Commission of India*. (2024, June 12). Britannica. https://www.britannica.com/topic/Election-Commission-of-India

Hatch, NK. (2024, May 18). *Free and fair elections: challenging the law* (BA Sunethra, Interviewer) [Personal Communication]

Hatch, NK. (2021). Historical Outline of Constitution Making and Development. In Hiran Jayawardene & Sharya Scharenguivel (Ed.) *Perspective on Constitutional Reforms in Sri Lanka.*

Hatch, NK. (2023) Franchise and Elections in Sri Lanka. In PAFFREL (Ed.), *Democracy – Theory and practice, Sri Lankan Experience*, (pp. 95-99). PAFFREL.

Herman, Edward S. & Chomsky, Noam. (2008). *Manufacturing Consent - The Political Economy of the Mass Media*. The Bodley Head Random House

*In a Legal Black Hole - Sri Lanka's Failure to Reform the Prevention of Terrorism Act*. (2022, February 7). Human Rights Watch. https://www.hrw.org/report/2022/02/07/legal-black-hole/sri-lankas-failure-reform-prevention-terrorism-act

International Obligations for Elections - Guidelines for Legal Frameworks. (2014). International Institute for Democracy and Electoral Assistance. https://www.idea.int/sites/default/files/publications/international-obligations-for-elections.pdf

Mesfin, Berouk. (2008). Democracy, Elections & Political Parties - A conceptual overview with special emphasis on Africa. *Institute for Security Studies*, 2. https://www.files.ethz.ch/isn/98951/PAPER166.pdf

*One Person, One Vote - The Constitution Project*. (2019, September 24). The Constitution Project. www.theconstitutionproject.com

Perera, Ramindu Lakkhika. (2024, May 15). *Consequences of postponing elections in Sri Lanka* (BA Sunethra, Interviewer) [Personal Communication]

Weeratunga, Manori. & Fernando, Eranda Roshan. *Recent trends of labour migration in Sri Lanka.* (2023, March 29). Daily FT. https://www.ft.lk/columns/Recent-trends-of-labour-migration-in-Sri-Lanka/4-746819

*18 Freedom of Speech Quotes You Should Know*. (2024, May). Freedom Forum. https://www.freedomforum.org/freedom-of-speech-quotes/5

*History of Elections*. (2024). Dual Elections. https://www.duvalelections.com/General-Information/Learn-About-Elections/History-Of-Elections

UDHR. United Nations. https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights

Webb, Paul David., Gibbins, Roger & All. *Election: Political Science.* (2024, June 2). Britannica. https.://www.britannica.com/topic/election-political-science

Transparency International Sri Lanka
366, Nawala Road, Nawala,
Rajagiriya,
Sri Lanka.

Phone: +94  11 4 369 781
Fax: +94  11 2 865 777
Email: tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

twitter.com/tisrilanka
lk.linkedin.com/company/tisrilanka
facebook.com/tisrilanka
instagram.com/transparency_sri_lanka
youtube.com/user/tisrilankatube